# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
# மனிதவலு வேலைவாய்ப்புத் திணைக்களம்
# Department of Manpower & Employment

## කාර්ය සාධන වාර්තාව - 2014
## செயலாற்றுகை அறிக்கை - 2014
## Performance Report - 2014








මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

9 වන මහල, සෙත්සිරිපාය (දෙවන අදියර)

බත්තරමුල්ල.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

மனிதவலு வேலைவாய்ப்புத் திணைக்களம்

Department of Manpower & Employment

# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2014

## පටුන


1. හැඳින්වීම ........ 2

1.1. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ........ 2

1.2. රාජකාරී ඉටු කිරීමේ විෂය පථය ........ 2

1.3. උපාය මාර්ගික දිශානතිය ........ 3

1.4. දෙපාර්තමේන්තුවේ ගමන්මග ........ 4

1.5. දීර්ඝ කාලීන ඉලක්ක ........ 4

1.6. දෙපාර්තමේන්තුවේ අරමුණු ........ 4

1.7. දෙපාර්තමේන්තුවේ අංශ ........ 5

2. සංවිධාන ව්‍යුහය ........ 6

2.1. අනුමත සහ 2014 / 12 / 31 දිනට සේවක සංඛ්‍යාව ........ 7

2.2 මානව සම්පත් සංවර්ධන සහකාරවරුන්ගේ තොරතුරු සාරාංශය - 2014 ........ 8

3. පාලන අංශය ........ 9

3.1. කාර්ය මණ්ඩල තොරතුරු ........ 9

3.1.1. මාණ්ඩලික නිලධාරීන් අළුතින් බඳවා ගැනීම් ........ 9

3.1.2. මාණ්ඩලික නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් ........ 9

3.2. කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය හා සුභසාධනය ........ 10

3.3. කාර්ය මණ්ඩල පුහුණුව ........ 10

3.4. මූල්‍ය පරිපාලන සාරාංශය - 2014 ........ 11

**4. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන සහ වෘත්තීය මාර්ගෝපදේශ අංශය ........ 13**

4.1. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය ........ 13

4.1.1. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ........ 14

4.1.2. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන් - සමස්ථ ප්‍රගතිය - 2014 ........ 14

4.2. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය .................... 15
4.2.1. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් .................... 15
4.2.2. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්- සමස්ත ප්‍රගතිය - 2014 .................... 16

**5. මිනිස්බල සැලසුම් සංවර්ධන සහ පර්යේෂණ අංශය .................... 17**

5.1. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය .................... 17
5.1.1. අරමුණු.................... 17
5.1.2. කර්තව්‍යයන්.................... 17
5.1.3. වාර ප්‍රකාශන .................... 17
5.1.4. 2014 වර්ෂයේ සිදු කරනලද සමීක්ෂණ .................... 17
5.1.5. මිනිස්බල සැලසුම් සංවර්ධන සහ පර්යේෂණ අංශය - සමස්ථ ප්‍රගතිය - 2014.................... 20
5.1.6. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ සමීක්ෂණයන් සඳහා වියදම් වූ මුදල් සහ ඉතිරි මුදල් .. 21

5.2. මහජන රැකියා සේවා මධ්‍යස්ථාන (Public Employment Service (PES) Centers).................... 22
5.2.1. පසුබිම .................... 22
5.2.2. මහජන රැකියා සේවාවේ අරමුණු.................... 22
5.2.3. මහජන රැකියා සේවා මධ්‍යස්ථානය මඟින් ඉටු කරන කාර්යයන් .................... 23
5.2.4. දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන ස්ථාන .................... 23
5.2.5. මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වල කාර්ය සාධනය - 2014 .................... 24
5.2.6. දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරනු ලබන රැකියා පොළ වැඩසටහන .................... 25

**6. දෙපාර්තමේන්තු ප්‍රකාශන - 2014.................... 26**

6.1. මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශයේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මගින් 2014 වර්ෂයේ දී නිකුත් කළ ප්‍රකාශන .................... 26

6.2. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය මගින් 2014 වර්ෂයේදී නිකුත් කළ හසර සඟරා .................... 27

# 1. හැඳින්වීම

## 1.1. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ 2010 පෙබරවාරි 2 වන දින අංක 1640/31 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2010 ජනවාරි 01වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දිවයිනේ සමස්ත මානව සම්පතෙහි වර්ධනය උදෙසා ශක්තිමත් වෘත්තිකයින් බිහිකිරීමේ අරමුණින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවකි.

## 1.2. රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකරලීමට බලාපොරොත්තු වේ.

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස්කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ සහ ප්‍රවර්ධන කටයුතු.
- වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම.
- ශ්‍රම වෙළඳපොල තොරතුරු එක්රැස් කිරීම විශ්ලේෂණය සහ බෙදා හැරීම.
- එවකට රැකියා පියස මඟිනුත් වර්තමානයේදී එය මහජන රැකියා සේවාව (Public Employment Service – PES ) හරහාත් ඉටු කරනු ලබන සියළු කටයුතු.

මේ අනුව මෙම දෙපාර්තමේන්තුව මඟින් මානව සම්පත තුළ තිබෙන ශක්තීන් හා හැකියාවන් මෙන්ම ඒ හරහා අදාළ පුද්ගලයන්ට ලඟාකර ගත හැකි ඉහත ධනාත්මක වටිනාකම් හඳුනාගෙන ඒ සඳහා වැදගත්,ඉහළ මෙන්ම ප්‍රයෝජනවත් වටිනාකමක් එකතුකළ හැකි ආකාරයකට ඔවුන්ගේ වෘත්තීය අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය මඟ පෙන්වීම, ඒ සඳහා ඉඩකඩ ලබාදීම, මාර්ග සකස් කර දීම, විවිධ රැකියා සඳහා පෙළඹවීම, හැකියාව වර්ධනය, සුළු පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රැකියා ක්ෂේත්‍රය තුළ සිටින රැකියා හිමියන් හා ඉල්ලුම්කරුවන් එකිනෙකා මුණ ගැස්වීම සහ දිවයින තුළ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම හා අවශ්‍යතා මත එම තොරතුරු ලබාදීම ආදි කටයුතු රාශියක් ඉටුකළ හැකිය.

**1.3.** උපාය මාර්ගික දිශානතිය

# දැක්ම

***“ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රමබලකායක්”***

# මෙහෙවර

***“පුළුල් නිපුනතාවයෙන් යුත් ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩ නැගීම සහ අපේ මානව සම්පත් වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම.”***

## 1.4. දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

2010 වර්ෂයේ පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් තුළින් ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් මෙරට ආර්ථිකය ශක්තිමත් කරලීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම සඳහා කටයුතු කර ඇත.

## 1.5. දීර්ඝ කාලීන ඉලක්ක

ගෝලීය වශයෙන් පවතින තරඟකාරීත්වයන් හා අභියෝගයන් හමුවේ එම තත්ත්වයන්ට ගැලපෙන පරිදි හා ඊට අනුගත වන පරිදි ශ්‍රම බලකායක් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වේ. ඒ අනුව ලෝක මට්ටමේ ශ්‍රී ලාංකීක ශ්‍රම බලකායක් ඇති කිරීම දැක්ම කරගත් මෙම දෙපාර්තමේන්තුවේ දිගුකාලීන ඉලක්ක පහත පරිදි වර්ගීකරණය කල හැකිය.

1. ගෝලීය වශයෙන් තරගකාරී, නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩනැංවීම.
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු පද්ධතියක් ඇතිකිරීම.

## 1.6. දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.

1. ජාතික මිනිස්බල ප්‍රතිපත්තිය සකස්කර, ප්‍රතිපත්තිය සහ අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රම බලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම, සංවර්ධනය හා පුරෝකථනය.
5. අවිධිමත් අංශය සංවර්ධනය.
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම.
8. අවධානමට ලක්වී ඇති කණ්ඩායම්, ආබාධිත පුද්ගලයින් සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම.

9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම.


10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැඹියාවන් පූරෝකථනය

මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන සත්කාරයයන් ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 1.7. දෙපාර්තමේන්තුවේ අංශ

- පාලන අංශය
- ගිණුම් අංශය
- මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය
    - ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය
    - මහජන රැකියා සේවය
- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

## 2.සංවිධාන ව්‍යුහය




1. ග්‍රාමීය රැකියා හා ක්‍ෂුද්‍ර මූල්‍ය වැඩසටහන
2. අවිධිමත් අංශයේරැකියා ප්‍රවර්ධනවැඩසටහන
3. රැකියා යෝග්‍යතාසංවර්ධන වැඩසටහන
4. රැකියා සමාජ වැඩසටහන

1. වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු පද්ධති සැකසීම හා බෙදාහැරීම
2. වෘත්තීය මාර්ගෝපදේශඅධ්‍යනය හා පර්යේෂණ
3. . වෘත්තීය මාර්ගෝපදේශවැඩසටහන්ක්‍රියාත්මක කිරීම.

1. වැඩසටහන් සැලසුම් කිරීමමෙහෙයවීම හා ඇගයීම
2. ක්‍ෂේත්‍ර වැඩසටහන්සම්බන්ධීකරණය
3. නව වැඩසටහන් හඳුනාගැනීම හා සැලසුම් කිරීම.

1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු
4. ගබඩා සේවය
5. සුභසාධන කටයුතු

1. වාර්ෂික සැලසුම්සැකසීම හා වාර්තාසැකසීම.
2. කාර්ය මණ්ඩල සංවර්ධනය
3. ප්‍රගති ඇගයීම් කටයුතු
4. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
5. දෙපාර්තමේන්තුප්‍රකාශන

1. ශ්‍රම වෙළඳපොළප්‍රවනතා අධ්‍යනය
2. ශ්‍රම වෙළඳපොළතොරතුරු එකතු කිරීම
3. විශ්ලේෂණයකිරීම හාබෙදාහැරීම

1. මිනිස්බලය පුරෝකථනයකිරීම.
2. ආංශික මිනිස්බල සැලසුම්සැකසීම
3. අදාළ ආයතන සමඟසම්බන්ධීකරණය මඟින් සැලසුම්ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුකිරීම
4. මිනිස්බල සංවර්ධනයසඳහා ආදාළ ප්‍රතිපත්තිහා යෝජනා ක්‍රමසැකසීම හා

1. ජාතිකරැකීරක්‍ෂා සේවාජාලයක් සැකසීමහා ක්‍රියාත්මකකිරීම
2. රැකියාසේවාසපයන ආයතනඅතරසම්බන්ධීකරණය
3. රැකියා පොළ

1. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ කටයුතු

## 2.1. අනුමත සහ 2014 / 12 / 31 දිනට සේවක සංඛ්‍යාව

| අනු අංකය | තනතුර | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **1** | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ) | 1 | 1 | 0 |
| **2** | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ.I | 1 | 0 | 1 |
| **3** | අධ්‍යක්ෂ(රැකියා නිර්මාණ සහ වෘත්තීය මාර්ගෝපදේශ) | ශ්‍රී.ලං.ප.සේ.I | 1 | 0 | 1 |
| **4** | අධ්‍යක්ෂ(මිනිස්බල සැළසුම් සංවර්ධන සහ පර්යේෂණ) | ශ්‍රී.ලං.ප.සේ.I | 1 | 1 | 0 |
| **5** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී. ලං.ග. සේ.I | 1 | 1 | 0 |
| **6** | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ.II/ III | 2 | 0 | 2 |
| **7** | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මිනිස්බල සැළසුම් සංවර්ධන හා පර්යේෂණ) | ශ්‍රී.ලං.ප.සේ.II/ III | 2 | 2 | 0 |
| **8** | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ) | ශ්‍රී.ලං.ප.සේ.II/ III | 2 | 2 | 0 |
| **9** | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මිනිස්බල සැළසුම් සංවර්ධන හා පර්යේෂණ) | ශ්‍රී.ලංක්‍ර.සේ.II/III | 1 | 1 | 0 |
| **10** | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ) | ශ්‍රී.ලං.ක්‍ර.සේ.II/III | 1 | 0 | 0 |
| **11** | පරිපාලන නිලධාරී | රා.කළ.සේ.අධි | 1 | 0 | 1 |
| **12** | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය I/II | 1 | 0 | 1 |
| **13** | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී | ආශ්‍රිතසේවා | 85 | 33 | 52 |
| **14** | ව්‍යාපෘති නිලධාරී | ආශ්‍රිතසේවා | 3 | 3 | 0 |
| **15** | මානව සම්පත් සංවර්ධන සහකාර | ආශ්‍රිතසේවා | 570 | 470 | 100 |
| **16** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සේ.I,II,III | 15 | 12 | 3 |
| **17** | රියදුරු | රියදුරු සේවය | 7 | 7 | 0 |
| **18** | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ II/III. | 7 | 7 | 0 |
| | එකතුව | | **702** | **543** | **159** |

**2.2.** මානව සම්පත් සංවර්ධන සහකාරවරුන්ගේ තොරතුරු සාරාංශය - 2014

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | දිස්ත්‍රික් මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් පුරප්පාඩු සංඛ්‍යාව | දිස්ත්‍රික් මට්ටමින් පුරප්පාඩු සංඛ්‍යව | අතිරික්ත සංඛ්‍යාව | මුළු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| අම්පාර | 20 | 18 | 02 | 20 | 02 | 03 | - | 05 |
| අනුරාධපුරය | 23 | 15 | 04 | 19 | 08 | 01 | - | 09 |
| බදුල්ල | 15 | 09 | 04 | 13 | 06 | 01 | - | 07 |
| මඩකලපුව | 15 | 13 | 07 | 20 | 02 | - | 02 | 02 |
| කොළඹ | 13 | 13 | 05 | 18 | - | - | - | - |
| ගාල්ල | 19 | 19 | 07 | 26 | - | - | 02 | - |
| ගම්පහ | 13 | 13 | 08 | 21 | - | - | 03 | - |
| හම්බන්තොට | 12 | 16 | 04 | 20 | - | 01 | 04 | 01 |
| යාපනය | 15 | 15 | 05 | 20 | - | - | - | - |
| මහනුවර | 20 | 20 | 08 | 28 | - | - | 03 | - |
| කෑගල්ල | 11 | 12 | 08 | 20 | - | - | 01 | - |
| කළුතර | 14 | 14 | 08 | 22 | - | - | 03 | - |
| කුරුණෑගල | 30 | 32 | 09 | 41 | - | - | 06 | - |
| මාතර | 16 | 16 | 10 | 26 | - | - | 05 | - |
| මාතලේ | 11 | 09 | 05 | 14 | 02 | - | - | 02 |
| මොණරාගල | 11 | 10 | 02 | 12 | 01 | 03 | - | 04 |
| නුවරඑළිය | 05 | 04 | 02 | 06 | 01 | 03 | - | 04 |
| පුත්තලම | 16 | 14 | 04 | 18 | 02 | 01 | - | 03 |
| පොළොන්නරුව | 07 | 05 | 01 | 06 | 02 | 04 | - | 06 |
| රත්නපුර | 17 | 17 | 06 | 23 | - | - | 01 | - |
| ත්‍රිකුණාමලය | 11 | 08 | 02 | 10 | 03 | 03 | - | 06 |
| වව්නියාව | 04 | - | 03 | 03 | 04 | 02 | - | 06 |
| මන්නාරම | 05 | 03 | 02 | 05 | 02 | 03 | - | 05 |
| කිළිනොච්චිය | 04 | 04 | 04 | 08 | - | 01 | - | 01 |
| මුලතිව් | - | - | - | - | - | - | - | - |
| එකතුව | **327** | **299** | **120** | **419** | **35** | **26** | **30** | **60** |

# 3. පාලන අංශය

පාලන අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කරඇත.

I. ආයතන අංශය

II. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

## 3.1. කාර්ය මණ්ඩල තොරතුරු

### 3.1.1. මාණ්ඩලික නිලධාරීන් අළුතින් බඳවා ගැනීම්

| අනු අංකය | නම | තනතුර | සේවයට පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | එච්.ජී.ජී.ජේ.ධර්මසේන මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2014.12.03 |
| 2 | ටී.එච්.තාජුඩීන් මයා | ප්‍රධාන ගණකාධිකාරී | 2014.07.01 |
| 3 | මුදිතා පත්මජායි මෙය | අධ්‍යක්ෂ | 2014.04.03 |
| 4 | ඒ. සාරන්කන් මයා | අධ්‍යක්ෂ | 2014.04.25 |
| 5 | ඊ.එම්. නාලිකා එදිරිසිංහ මිය | අධ්‍යක්ෂ | 2014.04.01 |
| 6 | එම්.එන්.ගුණවර්ධන මිය | අධ්‍යක්ෂ | 2014.10.09 |
| 7 | ඒ.එම්.දිමුත් භාෂිත අතපත්තු මයා | සහකාර අධ්‍යක්ෂ | 2014.04.01 |
| 8 | ඩී.කේ. ඔෂානි මෙය | සහකාර අධ්‍යක්ෂ | 2014.04.01 |
| 9 | එච්.ඒ.සී. නිරුක්ෂිකා මිය | සහකාර අධ්‍යක්ෂ | 2014.08.14 |

### 3.1.2. මාණ්ඩලික නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වූ දිනය |
|---|---|---|---|
| 1 | කේ.ඩී.එන්.රංජිත් අශෝක මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2014.11.19 |
| 2 | ඩබ්.ඒ.ඩී.විජයරත්න මෙය | ප්‍රධාන ගණකාධිකාරී | 2014.07.01 |
| 3 | එච්.ඒ.හේමා පෙරේරා මිය | අධ්‍යක්ෂ | 2014.03.19 |
| 4 | මුදිතා පත්මජායි මෙය | අධ්‍යක්ෂ | 2014.08.15 |
| 5 | ජී.එච්.ආර්.ගුණවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ | 2014.04.24 |
| 6 | ඊ.එම්.එස්.ඩබ්.ඊරියගම මෙය | සහකාර අධ්‍යක්ෂ | 2014.04.24 |
| 7 | එස්.එස්.ගොඩකන්දආරච්චිගේ මයා | සහකාර අධ්‍යක්ෂ | 2014.06.19 |

### 3.2. කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය හා සුභසාධනය

කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සහ ඔවුන්ගේ සුභ සාධනය ඇති කරලීම සඳහා පහත කාර්යයන් 2014 වර්ෂය තුළදී ඉටුකර ඇත.

| අනු අංකය | අභිප්‍රේරණ / සුභසාධනය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 1 | සේවකයින් ස්ථිරකිරීම් | මානවසම්පත්සංවර්ධනසහකාරනිලධාරීන් |
| 2 | සේවකයින්ගේ වැටුප්වර්ධක ගෙවීම් | • ශ්‍රීලංකා පරිපාලන සේවයේ නිලධාරීන්<br>• ශ්‍රීලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්<br>• ව්‍යාපෘති නිලධාරීන්<br>• වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්<br>• මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්<br>• රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන්<br>• කාර්යාල සේවක සේවය<br>• රියදුරු |
| 3 | අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම් | නිලධාරීන් 60ක් සඳහා ලබා දී ඇත. |
| 4 | ආපදා ණය ගෙවීම් | නිලධාරීන් 55ක් සඳහා ලබා දී ඇත. |
| 5 | උත්සව අත්තිකාරම් | නිලධාරීන් 351ක් සඳහා ලබා දී ඇත. |

### 3.3. කාර්යමණ්ඩල පුහුණුව

පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී හා ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩ නැගීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන සීමිත ප්‍රතිපාදන මත වුවද තම කාර්ය මණ්ඩලය 2014 වර්ෂය තුලදී පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත.

| අනු අංකය | පුහුණුව | ආයතනය | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | කැළණිය විශ්වවිද්‍යාලය | 2 |
| 2 | Office Management and Office Procedures | නිපුණතා සංවර්ධන පදනම | |
| 3 | Annual Stock Verifications And Disposal Procedure | නිපුණතා සංවර්ධන පදනම | 2 |
| 4 | පුද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම | නිපුණතා සංවර්ධන පදනම | 5 |
| 5 | දෙමළ භාෂා පාඨමාලාව | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය | 36 |
| 6 | රාජ්‍ය ප්‍රසම්පාදන කාර්ය පටිපාටි | නිපුණතා සංවර්ධන අරමුදල | 1 |
| 7 | සිවිල් විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳපාඨමාලාව | නිපුණතා සංවර්ධන අරමුදල | 4 |
| 8 | නිවාඩු පිළිබඳ වාර්තා, එහි බලපෑම හා පුද්ගලික ලිපිගොනු | නිපුණතා සංවර්ධන අරමුදල | 1 |

| | | | |
|---|---|---|---|
| **9** | කාර්යාල කළමණාකරණය හා ආකල්ප සංවර්ධනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 6 |
| **10** | රාජ්‍ය මූල්‍ය කළමණාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2 |
| **11** | ප්‍රවාහන කළමණාකරණය | ඉදිකිරීම්,යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) | 1 |
| **12** | සේවාරම්භක පුහුණු වැඩසටහන (මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව) | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 35 |
| **13** | සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | කොළඹ විශ්වවිද්‍යාලය | 1 |
| **14** | දෙමළ භාෂා පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 1 |
| **15** | සිංහල භාෂා පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 2 |
| **16** | දෙපාර්තමේන්තුමය වැඩසටහන් පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණුව | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 36 |
| **17** | කාර්ය මණ්ඩල පුහුණුව | තලාහේන ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානය | 81 |
| **18** | English Conversation for Professionals | NIBM ආයතනය | 7 |
| **19** | ජාතික වෘත්තීය මාර්ගෝපදේශන ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 41 |
| **20** | රූපවාහිනි මාධ්‍ය පාඨමාලාව | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 1 |
| | එකතුව | | **265** |

### 3.4. මූල්‍ය පරිපාලන සාරාංශය - 2014

**වැය ශීර්ෂය -328**

| අනු අංකය | වියදම් වර්ගීකරණය | මුළු ප්‍රතිපාදන (රු.මි.) | 2014.12.31 දිනට වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| **1** | පුනරාවර්ථන | **249,372** | **249,272** | **100%** |
| **2** | ප්‍රාග්ධන | **24,600** | **23,479** | **95%** |
| | එකතුව | **273,972** | **272,751** | **100%** |

| ශීර්ෂය | වැය විස්තරය | අනුමත මූල්‍ය ප්‍රතිපාදන (රු ) | වියදම් කළ ප්‍රමාණය(රු) | 2014 අවසානයේ ඉතිරි (රු) |
|---|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 113,978,129 | 113,978,129 | - |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 336,217 | 336,217 | - |
| 1003 | වෙනත් දීමනා | 79,604,848 | 79,604,847 | 1 |
| | ගමන් වියදම් | | | |
| 1101 | දේශීය ගමන් වියදම් | 10,708,007 | 10,708,007 | - |
| 1102 | විදේශීය ගමන් වියදම් | 287,514 | 287,514 | - |
| | සැපයීම් | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,938,235 | 2,938,235 | - |
| 1202 | ඉන්ධන | 2,200,000 | 2,137,285 | 62,715 |
| 1203 | ආහාරපානහානිල ඇඳුම් | 44,000 | 44,000 | - |
| | නඩත්තු වියදම් | | | |
| 1301 | වාහන | 865,586 | 865,586 | - |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 290,545 | 290,545 | - |
| | සේවා | | | |
| 1401 | ප්‍රවාහන | 419,959 | 419,959 | - |
| 1402 | තැපැල් හා සන්නිවේන | 1,499,886 | 1,499,886 | - |
| 1403 | විදුලිය හා ජලය | 1,945,601 | 1,945,601 | - |
| 1404 | කුලී හා ආයතන බදු | 25,476,038 | 25,476,038 | - |
| 1405 | වෙනත් | 1,178,005 | 1,178,005 | - |
| 1506 | රජයේ සේවකයන්ගේ දේපලණය | 7,600,000 | 7,562,276 | 37,724 |
| | මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 500,000 | 500,000 | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | 341,006 | 158,994 |
| 2003 | වාහන | 1,500,000 | 1,370,096 | 129,904 |
| | මූලධන වියදම් අත්පත් කරගැනීම | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500,000 | 488,758 | 11,243 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 700,000 | 700,000 | - |
| | හැකියා වර්ධනය | | | |
| 2401 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 4,000,000 | 3,792,483 | 207,517 |
| | වෙනත් මූලධන වියදම් | | | |
| 2502 | ආයෝජන | 9,000,000 | 8,732,751 | 267,249 |
| | රැකියා පියස | | | |
| 2502 | ආයෝජන | 3,000,000 | 3,000,000 | - |
| | ශ්‍රම වෙළඳ පොළ තොරතුරු පද්ධතියක් සකස් කිරිමේ වැඩසටහන | | | |

| | | | | |
|---|---|---|---|---|
| 2502 | ආයෝජන | 100,000 | 100,000 | - |
| ශක්තිමත් මහජන සේවයක් වැඩසටහන | | | | |
| 2502 | ආයෝජන | 400,000 | 400,000 | - |
| පරිගණක ජාලගත රැකියා පද්ධතිය , අන්තර්ජාලය මත පදනම් වූ තොරතුරු තාක්ෂණ පද්ධතිය හා සර්වරයන්හි යටිතල පහසුකම්වල තත්වය ඉහළ නැංවීම | | | | |
| 2502 | ආයෝජන | 500,000 | 484,000 | 16,000 |
| ශ්‍රම වෙළඳ පොළට ගැලපෙන රැකියා යෝග්‍ය කුසලතා වලින් යුත් මානව සම්පතක් බිහිකිරීම | | | | |
| 2502 | ආයෝජන | 2,000,000 | 2,000,000 | - |
| රැකියා පොළ වැඩසටහන | | | | |
| 2502 | ආයෝජන | 1,900,000 | 1,570,323 | 329,677 |

# 4. රැකියා නිර්මාණ,ප්‍රවර්ධන සහ වෘත්තීය මාර්ගෝපදේශ අංශය

යෞවන රැකියා අංශය ලෙස 1999 වර්ෂයේ දී යෞවන කටයුතු අමාත්‍යාංශයට යටතේ ආරම්භ කර ඇති මෙම අංශය 2010 වර්ෂයේදී මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී දෙපාර්තමේන්තුව යටතට පත් කර ඇත.

වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා නිර්මාණ, ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන විවිධ, එකිනෙක යාවූ වැඩසටහන් මාලාවක් තුලින් සමස්ථ ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිසි වෘත්තීන් කෙරේ යොමු කරවීම, නව රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීම මෙන්ම ජාතික ප්‍රතිපත්ති හා පුද්ගල හැකියා හා දක්ෂතාවයන්ට අනුකූල රැකියාවන් ප්‍රවර්ධනය කිරීමත් යන පුළුල් පරාසයක පැතිරුණ කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මෙම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා අංශය ඒකක දෙකකට බෙදා ඇති අතර, ඒ ඒ ඒකකය සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ මඟ පෙන්වීම යටතේ මෙම කාර්යයන්හි නිරත වේ. ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්,මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් හා සංවර්ධන නිලධාරී මඟින් මෙම වැඩසටහන් බිම් මට්ටම කරා රැගෙන යාම සිදුවේ.

### 4.1. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය

වර්තමානයේදී ද ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස වර්ගීකරණය වී ඇති අතර, අනෙකුත් ක්ෂේත්‍රයන් වෙත වැඩි නැඹුරුවක් වත්මන් තරුණ ප්‍රජාව දැක්වුවද ඒ සඳහා ඇති ඉඩ ප්‍රස්ථාව පිළිබඳ දැනුවත්කම ප්‍රමාණවත් නොවේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළද විවර වී ඇති නව රැකියා අවස්ථා හා ව්‍යාපාර අවස්ථා සම්බන්ධයෙන් තරුණයන්ගේ දැනුවත්භාවය සතුටුදායක මට්ටමක නොමැත.

මෙම අවශ්‍යතාව සපුරාලීම පිණිස, රැකියා විරහිත තරුණ ප්‍රජාව සුදුසු රැකියාවන් සඳහා යොමු කිරීමත් තරුණ ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාව සංවර්ධනය සහ අවිධිමත් අංශය ප්‍රවර්ධනය තුලින් ව්‍යවසායකයින් නගා සිටු වීම සඳහා බල ගැන්වීමත් යන ප්‍රධාන කාර්යය ඉටු කිරීම සඳහා මෙම ඒකකය මුලිකත්වය ගනී.

### 4.1.1. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

- රැකියා සමාජ වැඩසටහන
- ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන
- පෞද්ගලික අංශයේ රැකියා ගත කිරීමේ වැඩසටහන
- නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන
- ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ වැඩසටහන
- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන
- අවශ්‍යතාමත පුහුණු වැඩසටහන
- ග්‍රාමීය රැකියා ව්‍යාපෘතිය හා ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන
- රැකියා සියය වැඩසටහන

මෙම වැඩසටහන් ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වූ අතර මෙමගින් දිවයින පුරා පැතිරී සිටින සේවාලාභීන් හට මහත් ප්‍රතිලාභ හිමි විය.

### 4.1.2. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන් - සමස්ත ප්‍රගතිය - 2014

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු. මිලියන |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | | |
| 1 | අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් | 150 | 255 | 6570 | 1.0483 |
| 2 | ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් | 50 | 56 | 1861 | 0.9857 |
| 3 | උද්‍යාන කළමනාකරණ වැඩසටහන් | 10 | 11 | 385 | 0.376709 |
| 4 | පෞද්ගලික අංශයේ රැකියා ගත කිරීම් වැඩසටහන් | 15 | 10 | 508 | 0.0616 |
| 5 | නිදහස් රැකියා අවස්ථා ප්‍රවර්ධන වැඩසටහන් | 20 | 26 | 803 | 0.21146 |
| 6 | සංචාරක ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | 7 | 8 | 386 | 01756 |
| 7 | රැකියා සමාජ වැඩසටහන් | 90 | 90 | 2854 | 1.811 |

## 4.2. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

වෘත්තීය මාර්ගෝපදේශය යන විෂය නිරන්තරයෙන් කතා බහට ලක් වන විෂයක් බවට පත්ව ඇති අතර , ශ්‍රී ලාංකික සමාජය තුළ මෙය ප්‍රචලිත කිරීමත්, මෙහි අගය තහවුරු කිරීමත් කළ යුතුය.මෙමගින් නිරන්තරයෙන් වැඩලොවට එකතු වන සෑම අයෙකුටම ස්ථාවරත්වයක් හා නිසි වටිනාකමක් ලබා ගැනීමට අවකාශ ඇත. එබැවින්, අනාගතයේ ශ්‍රම බලකායට එකතුවීමට නියමිත පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව ඉලක්ක කර ගනිමින් විවිධ වැඩසටහන් / ක්‍රියාකාරකම් ඔස්සේ වෘත්තීය මාර්ගෝපදේශ සේවාව ලබාදීමටත්, විවිධ කඩඉම්වලදී සාමාන්‍ය අධ්‍යාපනයෙන් බැහැර වන්නන් සඳහා නිසි මඟ පෙන්වීමක් ලබාදීමත්, රැකියා නියුතු වුවන්ගේ වෘත්තීය කාර්යය සාධනය ඉහළ නැංවීමත් මෙම ඒකකයේ කාර්යය අතර ප්‍රමුඛතාවය ගනී.

ශ්‍රී ලංකාවේ නිසි වෘත්තීය මාර්ගෝපදේශය හා වෘත්තීය උපදේශ සේවාව ලබා දෙන ප්‍රමුඛතම ආයතනයක් ලෙස, ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් වන අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල හා පාසල් පද්ධතිය පුරා පැතිරුණු විවිධ වැඩසටහන් රාශියක් මෙම අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. වර්ෂය තුළදී සමස්ත සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විෂය ධාරාව උගන්වනු ලබන පාසල් වලින් 40% ආසන්න ප්‍රමාණයක් ද රාජ්‍ය විශ්ව විද්‍යාල වලින් 90%ක්ම වැඩසටහන් පැවැත්වීම මඟින් ශිෂ්‍ය ප්‍රජාව අතරට ගොස් ඔවුනට අවශ්‍ය වෘත්තීය මඟපෙන්වීම ලබාදීමට හැකිවීම සුවිශේෂී අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

### 4.2.1. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

- වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන
- ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන
- ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන
- අභ්‍යන්තර උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
- බාහිර උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
- උසස් පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
- සාමාන්‍ය පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
- හසර වෘත්තීය මාර්ගෝපදේශ සඟරා ප්‍රකාශයට පත් කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශ සේවාව ලබා දීම
- දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන
- වෘත්තීය මංපෙත් වැඩසටහන

### 4.2.2. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්- සමස්ථ ප්‍රගතිය - 2014

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන්සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු. මිලියන) |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | සපුරා ගැනීම් | | |
| 01 | අ.පො.ස.(සා.පෙළ) සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1816 | 1890 | 54,946 | - |
| 02 | අ.පො.ස.(උ.පෙල) සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1661 | 1471 | 44,325 | - |
| 03 | වෘත්තීය අභියෝග ජයගැනීමේ වැඩසටහන | 100 | 114 | 3709 | 0.74078 |
| 04 | ස්වයං රැකියා සඳහා පෙළඹවීටම් වැඩසටහන | 100 | 155 | 4852 | 0.16789 |
| 05 | බාහිර උපාධි වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 15 | 20 | 804 | 0.5277 |
| 06 | අභ්‍යන්තර උපාධි වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 15 | 09 | 478 | 0.2485 |
| 07 | ගුරුවරුන් සඳහා වන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | 24 | 30 | 967 | 0.6410 |
| 08 | දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන | 10 | 26 | 636 | 0.1754 |
| 09 | වෘත්තීය මංපෙත් වැඩසටහන | 10 | 15 | 4306 | 0.2914 |
| 10 | වෘත්තීය මාර්ගෝපදේශන සේවා සැපයීම | - | 17,248 | 33,082 | - |

ශ්‍රී ලාංකික පාසල් පද්ධතියෙන් 30% ටත් වඩා ප්‍රමාණයක් ආවරණය කරමින්ද, රාජ්‍ය විශ්ව විද්‍යාල වලින් 90%ක්ම ආවරණය කරමින්ද ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන් තුළින් ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කර ඔවුන්ගේ අනාගත වෘත්තීය දිවිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කරනු ලබයි. අධ්‍යාපන මාර්ගයෙන් බැහැරව නව මං සොයනා දැයේ දරුවන් මෙන්ම ස්වයං රැකියාවන්හි නිරත වෙමින් දෙපයින් නැගී සිටීමට වෙරදරන තරුණ ප්‍රජාවද මෙම වැඩසටහන් වල ඉලක්ක කණ්ඩායම් වලට ඇතුළත් විය.

# 5. මිනිස්බල සැලසුම් සංවර්ධන සහ පර්යේෂණ අංශය

මෙම අංශයේ ඒකක දෙකකි.

- ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය
- මහජන රැකියා සේවා මධ්‍යස්ථානය

## 5.1. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය

### 5.1.1. අරමුණු

- ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා අධ්‍යයනය
- ශ්‍රම වෙළඳපොළ තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරිම හා බෙදාහැරීම.

### 5.1.2. කර්තව්‍යයන්

- ශ්‍රම වෙළඳපොළ ස්වභාවය හා උපනතීන් පිළිබඳ සමීක්ෂණයන් හා විශ්ලේෂණයන් සිදු කිරීම.

### 5.1.3. වාර ප්‍රකාශන

- LMI Bulletin (Annual)
- පාසල් පාදක සමාජ ආර්ථික දත්ත අත්පොත
- සමීක්ෂණ වාර්තා

### 5.1.4. 2014 වර්ෂයේ සිදු කරන ලද සමීක්ෂණ

➢ **දළ ජාතික සන්තුෂ්ඨිය පිළිබඳ සමීක්ෂණය.**

- ගම්පහ දිස්ත්‍රික්කය සම්බන්ධ කර ගනිමින් මෙම සමීක්ෂණය සිදු කරන ලදී .
- ගම්පහ ජනතාවගේ සංතුෂ්ඨිය, යහපැවැත්ම හා සංජානනය මැන බැලීම මූලික අරමුණ වේ.
- මෙය පාසල් සිසුන් හට, ගුරුවරුන්හට, වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ට, පොලිස් දෙපාර්තමේන්තුවට උපකාරී වනු ඇත.

➢ **දිස්ත්‍රික් මට්ටමින් රැකියා යෝග්‍යතාවය මැනීම පිළිබඳ සමීක්ෂණය.**

- දිස්ත්‍රික් මට්ටමින්(දිස්ත්‍රික්ක 08 ක්) රැකියා පොළ පවත්වා සකස් කරන ලද ප්‍රශ්නාවලියකට පිළිතුරු ලබා ගැනීමෙන් සමීක්ෂණය සිදු කරනු ලැබේ.
- ප්‍රශ්නාවලියෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව රැකියා සපයන්නන් ළඟ තිබෙන රැකියා හා රැකියා සොයන්නන් සතු අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම් සොයා බලා ඒ සඳහා දෙපාර්ශවයේම අවශ්‍යතා හඳුනා ගැනීම මූලික අරමුණු වේ.
- මෙය රැකියා සපයන්නන්, රැකියා සොයන්නන්, ගුරුවරුන්, වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ට උපකාරී වනු ඇත.

➢ **ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ පිළිබඳ අධ්‍යයනය.**

- ප්‍රධාන ඇඟළුම් ආයතන තුනක් තෝරා ප්‍රශ්නාවලියක් හරහා තොරතුරු ලබා ගැනීම.
- ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා හඳුනා ගැනීම, එම ක්ෂේත්‍රයේ යෙදී සිටින සේවකයින් රැකියාවෙන් ඉදිරියට ගමන් කළ යුතු ආකාරය හඳුනා ගැනීම මූලික අරමුණු වේ.
- ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා සපයන්නන් හට හා රැකියා සොයන්නන් හට ප්‍රධාන වශයෙන් උපකාරී වේ.

(සමීක්ෂණය සඳහා අවශ්‍ය සියළු තොරතුරු 2014 වර්ෂයේදී නොලැබීම නිසා 2015 වර්ෂයේ දී මෙම සමීක්ෂණය අවසන් කරනු ලැබේ.)

➢ **විදේශ රැකියා ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය.**

- විදේශ රැකියා නියුක්ති කාර්යංශයේ ද්විතික දත්ත පදනම් කර ගනිමින් මෙම සමීක්ෂණය සිදු කරනු ලැබේ.
- ශ්‍රී ලාංකිකයන් හට විදේශ ශ්‍රම වෙළඳපොළේ පවතින ශ්‍රම ඉල්ලුම හඳුනා ගැනීමත් ඒ සඳහා සපුරාලිය යුතු දක්ෂතා හා අනෙකුත් සුදුසුකම් විමසීමක් කිරීම අරමුණු කෙරේ.
- මෙය රැකියා සොයන්නන්, ශ්‍රමවෙළඳපොළ දත්ත භාවිත කරන්නන්,ප්‍රතිපත්ති සම්පාදකයින්හට, පුහුණු ආයතන සහ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ට උපකාරී වනු ඇත.

(සමීක්ෂණය සඳහා අවශ්‍ය සියළු තොරතුරු 2014 වර්ෂයේදී නොලැබීම නිසා 2015 වර්ෂයේ දී මෙම සමීක්ෂණය අවසන් කරනු ලැබේ.)

➢ **මහජන රැකියා සේවාව (PES) පිළිබඳ අධ්‍යයනය.**

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙන ප්‍රශ්නාවලියක් හරහා මෙය සිදු කරනු ලැබේ.
- මහජන රැකියා සේවා මධ්‍යස්ථානය වෙතින් ලබා දෙන සේවාව ගුණාත්මක වශයෙන් දියුණු කිරීම සඳහා අවශ්‍ය කරුණු විමසීම අරමුණු කෙරේ.
- අප දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, විශේෂයෙන්ම මහජන රැකියා සේවා මධ්‍යස්ථානය වෙත මෙම තොරතුරු ලබා දීම සිදු කෙරේ .

(සමීක්ෂණය සඳහා අවශ්‍ය සියළු තොරතුරු 2014 වර්ෂයේදී නොලැබීම නිසා 2015 වර්ෂයේ දී මෙම සමීක්ෂණය අවසන් කරනු ලැබේ.)

- **සංචාරක ක්ෂේත්‍රයේ අනාගත ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය.**
  - ආරුගම්බේ සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරියේ ද්විතීයික දත්ත මුල් කර ගනිමින් මෙම සමීක්ෂණය සිදු කරන ලදී.
  - ආරුගම්බේ සංචාරක කර්මාන්තය තුළ පවතින රැකියා අවස්ථා හඳුනා ගැනීම හා එම රැකියා අවශ්‍යතා සඳහා අවශ්‍ය කුසලතා, දැනුම, ආකල්ප පිළිබඳ විමසීම මූලික අරමුණු වේ.
  - මෙය වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්ට උපකාරී වනු ඇත.

- **ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනයේ දී සිදු වන අපතේ යාම පිළිබඳ සමීක්ෂණය.**
  - නුවරඑළියේ සිට කොළඹ මැනිං වෙළඳපොළ දක්වා එළවළු ප්‍රවාහනයේ යෙදෙන පාර්ශවයන් සම්බන්ධ කර ගනිමින් ප්ලාස්ටික් කූඩ වෙනුවට කාඩ්බෝඩ් පෙට්ටි භාවිත කිරීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලැබේ.
  - ප්ලාස්ටික් කූඩ වෙනුවට කාඩ්බෝඩ් පෙට්ටි භාවිතා කිරීම තුළින් ආර්ථිකමය වාසි ලබා ගැනීම මූලික අරමුණ වේ.
  - භාණ්ඩ නිෂ්පාදකයාගේ පටන් පාරිභෝගිකයා දක්වා වැදගත් වේ.

- **පාසල් පාදක සමාජ, ආර්ථික දත්ත අත් පොත නිර්මාණය.**
  - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු තොරතුරු, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තොරතුරු, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තොරතුරු, ලෝක බැංකු තොරතුරු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තොරතුරු ආදී ආශ්‍රිත ග්‍රන්ථ හා මූලාශ්‍ර උපකාරී කර ගනිමින් වාර්ෂිකව නිකුත් කරනු ලැබේ.
  - පාසල් දරුවන්ට සංඛ්‍යාන දත්ත ආශ්‍රයෙන් තොරතුරු ලබා දීම මූලික අරමුණ වේ.
  - ගුරුවරුන් හා පාසල් සිසුන් සඳහා උපකාරී වේ.

- **පුවත්පත් සමීක්ෂණය.**
  - “සිළුමිණ” හා “Sunday Observer” පුවත්පත් වල පළ කරන රැකියා ඇබෑර්තු දැන්වීම් මේ සඳහා යොදා ගනිමින් කාර්තුවකට එක් වාර්තාව බැගින් නිකුත් කරනු ලැබේ.
  - ශ්‍රම වෙළඳපොළේ ශ්‍රම ඉල්ලුම හඳුනා ගැනීම මූලික අරමුණ වේ.
  - රැකියා සොයන්නන්,ශ්‍රම වෙළඳපොළ දත්ත භාවිත කරන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයින්හට, පුහුණු ආයතන සහ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ට උපකාරී වනු ඇත.

### 5.1.5. මිනිස්බල සැලසුම් සංවර්ධන සහ පර්යේෂණ අංශය - සමස්ත ප්‍රගතිය - 2014

ජාතික මිනිස්බල සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමත් මිනිස්බල විෂය ක්ෂේත්‍රයට අදාලව ශ්‍රී ලංකාවේ කාලීන සංවර්ධන අවශ්‍යතාවයන්ට සරිලන ලෙස පර්යේෂණ හා සමීක්ෂණ මෙහෙයවීම, ශ්‍රම වෙළෙඳ පොළ පිළිබඳ පුරෝකතනය.

| අනු අංකය | වැඩසටහන | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | වියදම රු .මිලියන | භෞතිකප්‍රගතිය |
| 01 | දළ ජාතික සංතෘෂ්ඨීය පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | 242,590.00 | 100% |
| 02 | දිස්ත්‍රික් රැකියා යෝග්‍යතාවය මැනීම පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | 175,331.00 | 56% |
| 03 | ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | | 55% |
| 04 | විදේශ රැකියා ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය. | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | | 45% |
| 05 | මහජන රැකියා සේවයේ ක්‍රියාකාරිත්වය මැන බැලීම පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | | 45% |
| 06 | සංචාරක ක්ෂේත්‍රයේ අනාගත ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | | 100% |
| 07 | පුවත්පත් සමීක්ෂණය සහ ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව | සමීක්ෂණය කිරීම දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම. | | 90% |
| 08 | සමීක්ෂණ පිළිබඳ සමාලෝචන රැස්වීම. | අංශය මඟින් සිදු කළ සමීක්ෂණයන්හි සොයා ගැනීම් පිළිබඳ අනෙකුත් අංශ(අභ්‍යන්තර) දැනුවත් කිරීම හා ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීමග | 30,500.00 | 100% |
| 09 | හෝටල් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ පිළිබඳ ප්‍රකාශනය.(ඉංග්‍රීසි/සිංහල/දෙමළ) | | 258,264.00 | 100% |
| 10 | පාසල් පාදක සමාජ ආර්ථික දත්ත අත්පොත | තොරතුරු එක්රැස් කිරීම හා සකස් කිරීම. | 245,980.00 | 80% |
| 11 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | දේශන පරිගණකගත පුහුණුව මඟින් මිනිස්බල පුරෝකථන හැකියා වර්ධනය | 57,450.00 | 70% |
| 12 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. | | 11,500.00 | |
| 13 | අංශය සඳහා මුද්‍රණ යන්ත්‍රය/ ෆැක්ස් යන්ත්‍රය ලබා ගැනීම | | 100,000.00 | 100% |

### 5.1.6. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ සමීක්ෂණයන් සඳහා වියදම් වූ මුදල් සහ ඉතිරිමුදල්

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වැය ශීර්ෂය | වෙන්වූ මුදල රු.මි. | වියදම් වූ මුදල් රු.මි. | ඉතිරි මුදල | මුදල් ඉතිරි වීමට හේතුව |
|---|---|---|---|---|---|---|
| 1. | දිස්ත්‍රික් රැකියා යෝග්‍යතාවය මැනීම පිළිබඳ සමීක්ෂණය. | 328-1-1-1-2502-1 | 642,171.00 | 175,331.00 | 466,840.00 | සමීක්ෂණය සිදු කිරීමෙන් පසුව එහි දත්ත ඇතුළත් කිරීම සඳහා පරිගණක දත්ත ක්‍රියාකරුවන්ගේ හිඟය හේතුවෙන් දත්ත ඇතුළත් කිරීමේ කාර්යය සඳහා වෙන් කළ මුදල් ඉතිරි විය. |
| 2. | ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ පිළිබඳ සමීක්ෂණය | 328-1-1-1-2502-1 | 25,000.00 | | 25,000.00 | සමීක්ෂණය සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි උපයෝගී කර ගනිමින් එම ප්‍රශ්නාවලි අදාළ ආයතන සඳහා ලබා දී දත්ත එක් රැස් කිරීම හේතුවෙන් ඒ සඳහා මූල්‍යමය වියදමක් සිදු නොවීය. |
| 3. | විදේශ රැකියා ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය | 328-1-1-1-2502-1 | 25,000.00 | | 25,000.00 | මෙම සමීක්ෂණය සඳහා දත්ත රැස් කිරීමේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශය සම්බන්ධ කර ගත් අතර එම ආයතනය මඟින් දත්ත ලබා ගැනීමේදී ද මූල්‍යමය වියදමක් සිදු නොවීම හේතුවෙන් මුදල් ඉතිරි විය. |
| 4. | මහජන රැකියා සේවයේ ක්‍රියාකාරිත්වය මැන බැලීම පිළිබඳ සමීක්ෂණය. | 328-1-1-1-2502-1 | 25,000.00 | | 25,000.00 | මෙම සමීක්ෂණයෙහි දත්ත එක් රැස් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රශ්නාවලි තැපැල් මඟින් යොමු කළ අතර ඒ සඳහා වූ තැපැල් ගාස්තුව පාලන අංශය මඟින් ගෙවූ බැවින් ඒ සඳහා ද මූල්‍යමය වියදමක් සිදු නොවීය. |
| 5. | සංචාරක ක්ෂේත්‍රයේ අනාගත ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය. | 328-1-1-1-2502-1 | 25,000.00 | | 25,000.0000 | සමීක්ෂණයෙහි දත්ත රැස් කිරීම සඳහා අදාළ ආයතන වෙත ප්‍රශ්නාවලි යොමු කරමින් තොරතුරු ලබා ගත් බැවින් එම කාර්යය සඳහා මූල්‍යමය වියදමක් සිදු නොවීය. |
| 6. | පුවත්පත් සමීක්ෂණය හා ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව. | 328-1-1-1-2502-1 | 200,000.00 | | 200,000.00 | මෙම සමීක්ෂණයෙහි සඟරාව මුද්‍රණය කිරීම සඳහා වූ මුදල් ඉතිරි වීමට හේතුව වූයේ මිළ ගණන් කැඳවීමේ කාර්යයේදී අදාළ මුද්‍රණ ආයතනයන්ගෙන් මිළ ගණන් පිළිබඳ තක්සේරුව ලබා දීම ප්‍රමාද වීමයි. |
| 7. | සමීක්ෂණ පිළිබඳ සමාලෝචන රැස්වීම. | 328-1-1-1-2502-1 | 100,000.00 | 30,500.00 | 69,500.00 | සෙත්සිරිපාය ප්‍රධාන දේශන ශාලාවේ පැවැත්වීමට නියමිතව තිබූ මෙම රැස්වීම එකල අප දෙපාර්තමේන්තුව හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය ඒකාබද්ධව පැවති බැවින් ඵලදායිතා ලේකම් කාර්යාලයේ දේශන ශාලාව තුළ පැවැත් වීමට අවස්ථාව උදා වීම හේතුවෙන් ශාලා ගාස්තු වශයෙන් වෙන් කළ මුදල් ඉතිරි විය. |

## 5.2. මහජන රැකියා සේවා මධ්‍යස්ථාන(Public Employment Service(PES) Centers)

### 5.2.1. පසුබිම

රාජ්‍ය හා පුද්ගලික අංශවල හවුල් ව්‍යාපෘතියක් ලෙස අංක අමප/03/0874/130/23 EPD/464හා 2003.10.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රැකීරක්ෂා සේවා මධ්‍යස්ථාන ජාලය (රැකියා පියස) 2003 වර්ෂයේදී ස්ථාපනය කරන ලදි. ජාතික රැකීරක්ෂා ප්‍රතිපත්තියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු සබඳතා හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය පුළුල් පරාසයක් තුළ ලඟා විය හැකි පරිගණක පද්ධතියක් හරහා සියලු මධ්‍යස්ථාන එකිනෙකට සම්බන්ධ කරන ලදි. මුලින් විදේශ ආධාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ එය 2007.01.31 දක්වා ක්‍රියාත්මක විය. අනතුරුව කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශ විසින් 2007.01.24 දින ඉදිරිපත් කල අංක 2/2007 අමාත්‍ය මණ්ඩල සන්දේශයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා රැකියා පියස ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදි.

2010 වර්ෂයේදී එම විෂය පථය කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටවූ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට පැවරුණු අතර, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 03/2011 හා 2011.02.15 දිනැති සංදේශයට අනුව රැකියා පියස ප්‍රතිව්‍යුහගත කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද කරුණු සඳහා 2011 මැයි මස 12 දින තීරණය මඟින් අනුමැතිය ලැබී ඇත.

6/2011 අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබුණු තීරණ වලට අනුව Jobs Net ඇපයෙන් සීමිත සමාගම යටතේ පැවතුනු දිස්ත්‍රික් රැකියා පියස මධ්‍යස්ථාන මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදි. ඉන් පසුව දෙපාර්තමේන්තුව යටතේ ඇති කරන ලද දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත රැකියා පියස මධ්‍යස්ථාන සතුව තිබූ භෞතික සම්පත් ද පවරා දෙන ලදී. මෙසේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වාගෙන යමින් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් මහජන රැකියා සේවාව සැපයීමට අදාල කටයුතු ඉටුකරමින් පවති.

### 5.2.2. මහජන රැකියා සේවාවේ අරමුණු

- රැකියා සම්බන්ධීකරණය.
- ශ්‍රම වෙළඳපොල තොරතුරු ඒකකය ලෙස කටයුතු කිරීම
- ශ්‍රම වෙළඳපොල වැඩසටහන්ක්‍රියාත්මක කිරීම
- වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීමේ සේවාවන්
- PES මධ්‍යස්ථාන සම්බන්ධිත පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය
- පෞද්ගලික අංශයේ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි කිරීම හා සම්බන්ධීකරණය
- රැකියා වියුක්තිකයින් සඳහා ප්‍රතිලාභ සැළසීමේ ක්‍රමවේදයන්

**5.2.3.** **මහජන රැකියා සේවා මධ්‍යස්ථානය මඟින් ඉටු කරන කාර්යයන්**

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම
- රැකියා ඇබෑර්තු ලබාගැනීම සහ එම ආයතන ලියාපදිංචි කිරීම
- රැකියා ගැලපීම
- රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
- ඇබෑර්තු සහ රැකියා අපේක්ෂිතයින් ගැලපීම සහ ආයතන වලට සම්මුඛ පරීක්ෂණ සඳහා යොමු කිරීම
- රැකියාගත කිරීම් සහ පසු විපරම් කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම
- රැකියා අපේක්ෂිතයින් පුහුණු වෘත්තීය පුහුණු අවස්ථා සඳහා යොමු කිරීම

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කර ගැනීම, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින මානව සම්පත් සංවර්ධන නිලධාරීන් මඟින්, රැකියා ගවේශන වැඩසටහන්, රැකියා පොළ (ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්) හා කාර්යාලයට පැමිණෙන අපේක්ෂිතයන් ලියාපදිංචිය මඟින් සිදු කරනු ලැබේ. රැකියා අපේක්ෂිතයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා ඔවුන්ගේ රැකියා අපේක්ෂාවන් හඳුනා ගෙන අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම, දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් හා සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලැබේ.

**5.2.4.** **දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන ස්ථාන**

❖ වර්තමානයේ පහත සඳහන් ස්ථානවල මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය හා ස්ථානය | අනු අංකය | දිස්ත්‍රික්කය හා ස්ථානය |
|---|---|---|---|
| 1 | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 13 | පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2 | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 14 | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 3 | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 15 | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 4 | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 16 | මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 5 | කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 17 | මහනුවර - මහනුවර දිස්ත්‍රික් කම්කරුකාර්යාලය |
| 6 | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 18 | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 7 | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 19 | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 8 | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 20 | මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 9 | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 21 | යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 10 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 22 | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 11 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 23 | වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |

**5.2.5.** මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වල කාර්ය සාධනය - **2014**

| අනු අංකය | දිස්ත්‍රික්කය | රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචිය | රැකියා පුරප්පාඩු ලියාපදිංචිය | රැකියා ගැලපීම | රැකියාගත කිරීම |
|---|---|---|---|---|---|
| **1** | අනුරාධපුර | 920 | 355 | 433 | 178 |
| **2** | අම්පාර | 420 | 113 | 154 | 149 |
| **3** | කළුතර | 1162 | 1191 | 686 | 247 |
| **4** | කෑගල්ල | 1726 | 1822 | 1820 | 468 |
| **5** | කිලිනොච්චි | 751 | 434 | 453 | 118 |
| **6** | කුරුණෑගල | 2267 | 533 | 1689 | 295 |
| **7** | කොළඹ | 1801 | 654 | 962 | 118 |
| **8** | ගම්පහ | 1662 | 1265 | 2142 | 279 |
| **9** | ගාල්ල | 1062 | 337 | 845 | 236 |
| **10** | ත්‍රිකුණාමලය | 35 | 8 | 10 | 2 |
| **11** | නුවරඑළිය | 280 | 390 | 442 | 51 |
| **12** | පුත්තලම | 699 | 682 | 416 | 126 |
| **13** | පොලොන්නරුව | 304 | 91 | 146 | 64 |
| **14** | බදුල්ල | 817 | 1245 | 709 | 50 |
| **15** | මඩකලපුව | 1270 | 196 | 426 | 149 |
| **16** | මන්නාරම | 594 | 141 | 53 | 11 |
| **17** | මහනුවර | 1296 | 486 | 657 | 314 |
| **18** | මාතර | 1641 | 1017 | 1923 | 330 |
| **19** | මාතලේ | 242 | 358 | 154 | 89 |
| **20** | මොණරාගල | 224 | 86 | 166 | 93 |
| **21** | යාපනය | 1371 | 1827 | 998 | 363 |
| **22** | රත්නපුර | 1405 | 234 | 341 | 94 |
| **23** | වවුනියා | 659 | 530 | 368 | 247 |
| **24** | හම්බන්තොට | 672 | 1191 | 370 | 148 |
| | එකතුව | **23280** | **15186** | **16313** | **4219** |

**5.2.6. දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරනු ලබන රැකියා පොළ වැඩසටහන**

➢ **අරමුණු**

- දිස්ත්‍රික් මට්ටමෙන් වශයෙන් අප මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී සිටින මෙන්ම දිස්ත්‍රික්කයේ අනෙකුත් රැකියා අපේක්ෂිතයින් හා රැකියා සපයන ආයතන එකම ස්ථානයකදී මුණගැස්වීම.
- අදාල දිස්ත්‍රික්/ප්‍රාදේශීය රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම තුළින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.
- රැකියා අපේක්ෂිතයින්හට මෙම රැකියා පොළ හරහා වත්මන් ශ්‍රම වෙළඳපොළ, වැඩ ලෝකය පිළිබඳ දැනුමක් ලබා දීම.
- රැකියා පොළ මඟින් ඒ සඳහා සහභාගී වන රැකියා සපයන ආයතනවල පවතින පුරප්පාඩු සඳහා සුදුසුම අයදුම්කරුවන් රැකියා ගත කරවීම.
- වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පෞද්ගලික අංශයේ රැකියා පිළිබඳ ධනාත්මක ආකල්පමය වෙනසක් ඇති කිරීම.
- වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධ කරවා ගැනීම තුලින් රැකියා අපේක්ෂිතයින්හට අවශ්‍ය ඵලදායී පුහුණු අවස්ථා හඳුන්වාදීම සහ ඒවා වෙත යොමු කරවීම.
- ස්වයං රැකියා සහ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා සහය සපයන ආයතන හඳුන්වාදීම සහ ස්වයං රැකියා අවස්ථාවන් සඳහා යොමු වීම උදෙසා පහසුකම් සැපයීම.
- තම ආයතන වල පවතින රැකියා අවස්ථාවන් සහ රැකියා අපේක්ෂිතයින්ගෙන් ඔවුන් අපේක්ෂා කරන කුසලතා පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට එකී සේවා සපයන ආයතනවලට අවස්ථාවක් සැලසීම.

| අනු අංකය | පැවැත්වූ දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | සහභාගී වූ ආයතන සංඛ්‍යාව | සහභාගී වූ රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව | වියදම (රු) | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 01 | ත්‍රිකුණාමලය | 2014.05.24 | 23 | 351 | 113,244.00 | - |
| 02 | ගම්පහ | 2014.07.05 | 25 | 891 | 104,621.00 | - |
| 03 | කොළඹ | 2014.07.19 | 57 | 1264 | 126,750.00 | දිවි නැගුම දෙපාර්තමේන්තුව හා එක්ව සංවිධානය කරන ලදී. |
| 04 | අම්පාර (පොතුවිල්) | 2014.09.27 | 10 | 100 | 75,000.00 | සංචාරක දිනයට සමගාමීව සංචාරක මණ්ඩලයේ ඉල්ලීම පරිදි හා එක්ව ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහනක් ලෙස සංවිධානය කරන ලදී. |
| 05 | ගාල්ල | 2014.10.25 | 37 | 1500 | 142,997.00 | - |
| 06 | යාපනය | 2014.10.25 | 17 | 1080 | 93,000,00 | - |
| 07 | අනුරාධපුර | 2014.11.15 | 33 | 850 | 114,000.00 | - |
| 08 | රත්නපුර | 2014.11.22 | 43 | 1100 | 139,000.00 | - |

# 6. දෙපාර්තමේන්තු ප්‍රකාශන - 2014

## 6.1. මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශයේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මගින් 2014 වර්ෂයේ දී නිකුත් කළ ප්‍රකාශන

